936. සො'හං සුත්වාන සරණං සරණං මෙ අනුස්සරිං,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

937. ජාතියා සත්තවස්සෙන අරහත්තං අපාපුණිං,
උපසම්පාදෙසි[1] සම්බුද්ධො ගුණමඤ්ඤාය චක්ඛුමා.

938. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ සරණානි අගච්ඡි'හං,
තතො මෙ සුකතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ.

939. සුගොපිතං මෙ සරණං මානසං සුප්පණීහිතං,
අනුභොත්වා යසං සබ්බං පත්තොම්හි අචලං පදං.

940. යෙසං සොතාවධානත්ථි සුණාථ මම භාසතො,
අහං[2] වො කථයිස්සාමි සාමං දිට්ඨං පදං[3] මම.

941. "බුද්ධො ලොකෙ සමුප්පන්නො වත්තතෙ ජිනසාසනං,
අමතා වාදිතා භෙරී සොකසල්ලවිනොදනා.

942. යථාසකෙන ථාමෙන පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,
අධිකාරං කරෙය්‍යාථ පස්සයිස්සථ[4] නිබ්බුතිං.

943. පග්ගය්හ තීණි සරණෙ පඤ්ච සීලානි ගොපිය[5],
බුද්ධෙ චිත්තං පසාදෙත්වා දුක්ඛස්සන්තං කරිස්සථ.

944. මමොපමං කරිත්වාන[6] සීලානි පරිගොපිය,
අචිරං අරහත්තං වො සබ්බෙපි පාපුණිස්සථ".

945. තෙවිජ්ජා ඉද්ධිපත්තො'ම්හි චෙතොපරියකොවිදො,
සාවකො තෙ මහාවීර චරණෙ[7] වන්දති සත්ථුනො.

946. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ සරණං බුද්ධස්ස ගච්ඡහං,
දුග්ගතිං නාභිජානාමි සරණාගමනෙ ඵලං.

947. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිසරණගමනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**තිසරණගමනියත්ථෙරස්සාපදානං[8] තතියං.**

## 24. පඤ්චසීලසමාදානියත්ථෙරාපදානං

948. නගරෙ චන්දවතියා භතකො ආසි'හං තදා,
පරකම්මායනෙ යුත්තො පබ්බජ්ජං න ලභාම'හං.

949. තමන්ධකාරපිහිතා[9] තිවිධග්ගීහි[10] ඩය්හරෙ,
කෙන නු ඛො උපායෙන විසංයුත්තො භවෙ අහං.

950. දෙය්‍යධම්මො ච මෙ නත්ථි වරාකො භතකො[11] අහං,
යන්නූනා'හං පඤ්චසීලං රක්ඛෙය්‍යං පරිපූරයං.

1. උපසම්පාදයී, ම. 2. අත්ථං, සෙ. 3. දිට්ඨමිදං, P T S දිට්ඨපදං, සෙ.

4. පඤ්ඤසීසසථ, (සබ්බත්) 5 ගොපය, සෙ PTS. 6. සම්මා ධම්මං භාවෙත්වා, ම. 7. සරණො, ම. සෙ. සරණෙ, PTS. 8 සරණගමනිය, ම. 9. මහන්ධකාර පිහිතා, සෙ. 10. නිබ්බිධගී, පි PTS 11. භනතො දුක්ඛිතො, ම.



936. මම ඒ සරණ අසා (පෙර) මාගේ සරණය සිහි කෙළෙමි. ඒ අනුනෙහි ම සිද රහත්බවට පැමිණියෙමි.

937. උත්පත්තියෙන් සත්හැවිරිදි කල්හි රහත්බවට පැමිණියෙමි. පසැස් ඇති බුදුරජානන් වහන්සේ (මාගේ) ගුණ දැන (මා) උපසම්පන්න කළ සේක.

938. මම මෙයින් අපරිමෙය කල්පයකට පෙර සරණගත වීමි. ඉක්බිති මා විසින් මැනැවින් කරණලද (ඒ මාගේ) කර්මය තෙම මෙහි දී ඵලය දැක්වී ය.

939. මා විසින් සරණය මැනැවින් රක්නාලදී. සිත මනා ව පිහිටුවන ලදී. සියලු සම්පත් අනුභව කොට නිශ්චල වූ නිර්වාණපදයට පැමිණියෙම් වෙමි.

940. යමෙකුට ඇසීමෙහි එකඟකම ඇත්තේ නම්, (ඒ තෙපි) කියන්නා වූ මාගේ වචනය අසවු. මා විසින් (භික්ෂුනම්කගේ මාර්ග දෙශකත්වයෙන්) තමා විසින් දක්නා ලද ශාන්තපදය මම තොපට කියන්නෙමි. (කෙසේ ද ? යත්: )

941. "බුදුරජානන් වහන්සේ ලොව පහළ වූ සේක. සර්වඥශාසනය පවතී. සෝහුල් දුරු කරන්නා වූ අමාබෙරය වයනලදී.

942. සවකිය ශක්ති පමණින් නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි කුසල් කරන්නහු නම්, නිවණ පහස්නහු ය. (=ලබන්නහු ය).

943. තිසරණ ගෙණ පන්සිල් රැක බුදුන් වහන්සේ කෙරෙහි සිත පහදවා දුක් කෙළවර කරන්නහු ය.

944. මා උපමා කොට ගෙණ සිල් රැක තෙපි සියල්ලෝ නො බෝ කලකින් ම රහත්බවට පැමිණෙන්නහු ය".

945. ත්‍රිවිද්‍යා ඇත්තෙම් පරසිත් දන්නා නුවණෙහි දක්ෂ වූයෙම් ඍද්ධියට පත් වූයෙම් ද වෙමි. මහාවීරයන් වහන්ස, ඔබ වහන්සේගේ (ඒ) ශ්‍රාවක තෙම ශාස්තෲන්වහන්සේගේ සිරිපා වඳියි.

946. මම මෙයින් අපරිමෙය කල්පයෙහි බුදුරජානන් වහන්සේ සරණ කොට ගියෙමි. දුගතියක් නො දනිමි. (මෙය) සරණගමනයෙහි ඵලය යි.

947. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී. මෙහි මේ අයුරින් ආයුෂ්මත් **තිසරණගමනිය** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් සි.

**තිසරණගමනිය ස්ථවිරාවදානය තෙවැනි යි.**

## 24. පඤ්චසීල සමාදනිය ස්ථවිරාවදානය

948. එකල්හි මම **චන්ද්‍රවතී** නගරයෙහි බැලයෙක් (=බැලයට මෙහෙ කරන්නෙක්) වීමි. අනුන්ගේ කටයුතු කිරීමෙහි යෙදුනා වූ මම පැවිද්ද නො ලබමි.

949. මහත වූ මොහාන්ධකාරයෙහි වසන ලද (සත්වයෝ) (රාග-ද්වේෂ-මෝහ-යන) ත්‍රිවිධාග්නියෙන් දැවෙත්. මම කවර නම් උපායයකින් (භව දුකින්) වෙන් වූවෙක් වන්නෙම් ද?

950. මා ලඟ දිය යුතු දැයක් (=දෙයධර්මයක්) ද නැත. මම දුඃඛිත වූ බැළයෙක්මි. මම පඤ්චසීලය පරිපූර්ණ කරමින් රකින්නෙම් නම් ඉතා යෙහෙකි.



951. **අනොමදස්සි**[1] මුනිනො **නිසභො** නාම සාවකො,
තම්'හං උපසඞ්කම්ම පඤ්චසික්ඛාපද'ග්ගහිං.

952. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ,
තාවතා පඤ්ච සීලානි පරිපුණ්ණානි ගොපයිං.

953. මච්චුකාලම්හි [2] සම්පත්තෙ දෙවා අස්සාසයන්ති මං,
රථො සහස්සයුත්තො මාරිසා'යං[3] උපට්ඨිතො.

954. වත්තන්තෙ[4] චරිමෙ චිත්තෙ මම සීලං අනුස්සරිං,
තෙන කම්මෙන සුකතෙන තාවතිංසං අගච්ඡ'හං.

955. තිංසක්ඛත්තුඤ්ච දෙවින්දො දෙවරජ්ජං අකාරයිං,
දිබ්බං සුඛං අනුභවිං අච්ඡරාහි පුරක්ඛතො.

956. පඤ්චසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොස'හං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

957. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
පුරෙ **වෙසාලියං** ජාතො මහාසාලෙ සුඅඩ්ඪකෙ.

958. වස්සූපනායිකෙ කාලෙ දිප්පන්තෙ ජිනසාසනෙ,
මාතා ච මෙ පිතා චෙව පඤ්චසික්ඛාපද'ග්ගහුං.

959. සහ සුතෙන'හං සීසං මම සීලං අනුස්සරිං,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

960. ජාතියා පඤ්චවස්සො'හං අරහත්තමපාපුණිං,
උපසම්පාදයී බුද්ධො ගුණමඤ්ඤාය චක්ඛුමා.

961. පරිපුණ්ණානි ගොපෙත්වා පඤ්ච සික්ඛාපදාන'හං,
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ විනිපාතං න ගච්ඡ'හං.

962. ස්වාහං යසමනුභවිං තෙසං සීලානවාහසා,
කප්පකොටිම්පි කිත්තෙන්තො කිත්තයෙ එකදෙසකං.

963. පඤ්ච සීලානි ගොපෙත්වා තයො හෙතූ ලභාමහං,

[illegible]

964. පකිත්තෙන්තො[5] ච සබ්බසං අධිමත්තඤ්ච පොරිසං,
භවාභවෙ සංසරිත්වා එතෙ ඨානෙ ලභාමහං.

965. අපරිමෙය්‍ය සීලෙසු වත්තන්තො ජිනසාවකො[6],
භවෙසු යදි රජ්ජෙය්‍ය[7] විපාකො කීදිසො භවෙ.

---

1. දසසිස්ස, ම. P T S. සෙ.
2. කාලෙ ච, ම.
3. මාරිසස්ස, ම.
4. සම්පත්තෙ, P T S.
5. සංකිත්තෙන්තො, ම. P T S.
6. වත්තන්තො ජිනසාවකො ම.
7. රජ්ජියෙථුං, ම.



951. **අනවමදර්ශී** බුදුරජාණන් වහන්සේගේ **නිසභ** නම් ශ්‍රාවකයෙක් වී ය. මම උන්වහන්සේ වෙත එළඹ පඤ්චශික්ෂාපද (=පන්සිල්) ගතිමි.

952. එකල්හි හවුරුදු ලක්ෂයක් ආයුෂ විද්‍යමාන වේ. එපමණ කලක් සම්පූර්ණ වූ පන්සිල් රැකිමි.

953. මැරෙණ කල පැමිණි කල්හි දෙවියෝ මා අස්වසත්. (කෙසේ ද? යත්:) "නිදුකාණෙනි, ඔබට මේ දහසක් අසුන් යෙදූ (දිව්‍ය) රථය එළඹ සිටියේ ය" (කියාති.)

954. අන්තිම සිත (=චුතිචිත්තය) පවත්නාකල්හි මාගේ (පඤ්ච) සීලය සිහි කෙළෙමි. මැනැවින් කරණලද (ඒ කුශල)කර්මය හෙතු කොට ගෙණ මම තව්තිසාදෙව්ලොවට ගියෙමි.

955. ශක්‍රදෙවෙන්ද්‍ර ව තිස්වරක් දිව්‍යරාජ්‍යය කරවීමි. අප්සරාවන් විසින් පිරිවරණ ලදු ව දිවසුව අනුභව කෙළෙමි.

956. මම පන්සැත්තෑවරක් සක්විති රජ වීමි. (ලබනලද) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් (මෙපමණ ය යි) කිය නො හැකිය.

957. කුශලමූලයෙන් මෙහෙයන ලදුයෙම් දෙව්ලොවින් චුත ව වෛශාලි නගරයෙහි අතිශයින් ආඪ්‍ය වූ මහාසාරකුලයෙහි උපන්නෙමි.

958. බුදුසසුන බබලද්දී වස් එළඹෙන කාලයෙහි මාගේ මවු තොමෝ ද පිය තෙමේ ද පඤ්චශික්ෂාපද (පන්සිල්) ගත්තාහු ය.

959. (එය) ඇසීම හා සමග ම වහා මාගේ ශීලය මම සිහි කෙළෙමි. එම අසුනෙහි ම හිඳ රහත්බවට පැමිණියෙමි.

960. උත්පත්තියෙන් පස්හැවිරිදි වූ මම රහත්බවට පැමිණියෙමි. පසැස් ඇති බුදුරජ තෙම (මාගේ) ගුණ දැන (මා) උපසපන් කරවී ය.

961. මම සම්පූර්ණ පන්සිල් රැක මෙයින් අපරිමෙයකල්පයෙහි (සිට) දුගතියකට නො ගියෙමි.

962. එම පන්සිල්හි අනුහසින් ඒ මම සම්පත් අනුභව කෙළෙමි. (ඒ සම්පත්) කල්පකොටියක් මුළුල්ලෙහි වර්ණනා කරන්නේ නමුදු ලෙශ මාත්‍රයක් ම වර්ණනා කරන්නේ ය.

963. මම පන්සිල් රැක අනුසස් තුණක් ලබමි. (කවර නම් අනුසස් තුණෙක් ද ? යත්-) මම දීර්ඝායු ඇත්තෙම් වෙමි. මහත් වූ භොගසම්පත් ඇත්තෙම් වෙමි. තීක්ෂණ ප්‍රඥ ඇත්තෙම් ද වෙමි.

964. සියලු දෙනාහට (තමාගේ) අධිමාත්‍ර වූ ශූර භාවය ප්‍රකාශ කරන්නාක් මෙන් කුදුමහත් භවයෙහි (සසරෙහි) හැසිර මම මෙ ම තනතුරු ලබමි.

965. අප්‍රමාණ වූ ශීලයන්හි (රැකීම් වශයෙන්) පවත්නා බුද්ධශ්‍රාවක තෙමේ ඉදින් භවයන්හි රැඳෙන්නේ නම්, විපාකය කොබඳු වන්නේ ද



966. සුචිණ්ණං මෙ පඤ්චසීලං භතකෙන විපස්සිනා,
තෙන සීලෙන'හං අජ්ජ මොචයිං[1] සබ්බබන්ධනං.

967. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ පඤ්ච සීලානි ගොපයිං,
දුග්ගතිං නාභිජානාමි පඤ්චසීලානි'දං ඵලං.

968. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පඤ්චසීලසමාදානියො ථෙරො**. ඉමා ගාථායො අභාසිත්ථාති.

**පඤ්චසීලසමාදානියත්ථෙරස්සාපදානං චතුත්ථං.**

## 25. අන්නසංසාවකත්ථෙරාපදානං

969. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ගච්ඡන්තං අන්තරාපණෙ,
කඤ්චනග්ඝියසඞ්කාසං ද්වත්තිංසවරලක්ඛණං.

970. **සිද්ධත්ථං** ලොකපජ්ජොතං අප්පමෙය්‍යං අනොපමං,
අලත්ථං පරමං පීතිං දිස්වා දන්තං ජුතින්ධරං.

971. සම්බුද්ධං අභිමන්තෙත්වා[2] භොජයිං තං මහාමුනිං,
මහාකාරුණිකො[3] නාථො[4] අනුමොදි මමං තදා.

972. තස්මිං මහාකාරුණිකෙ පරමස්සාසකාරකෙ,
බුද්ධෙ චිත්තං පසාදෙත්වා කප්පං සග්ගම්හි මොද'හං.

973. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,

දුග්ගතිං නාභිජානාමි භික්ඛාදානස්සි’දං ඵලං.

974. පටිසම්භිදා -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අන්නසංසාවකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

**අන්නසංසාවකත්ථෙරස්සාපදානං පඤ්චමං.**

## 26. ධූපදායකත්ථෙරාපදානං

975. **සිද්ධත්ථස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො,
කුටිධූපං[5] මයා දින්නං විප්පසන්නෙන චෙතසා.

976. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සබ්බෙසම්පි පියො හොමි ධූපදානස්සි’දං ඵලං.

---

1. පොඨයිං, P T S. 2. අතිතාමෙත්වා, අභිතාමෙත්වා, ම සෙ.
3. මුනි කාරුණිකො, P T S. 4 ලොකෙ, ම 5 කුටිධූපනං, P T S. සෙ.



966. විශෙෂ දැකුම් ඇති බැලයකු වූ මා විසින් පන්සිල් මැනැවින් හැසිරෙණ (=රක්නා)ලදී. මම එ ම ශීලය හේතු කොට ගෙණ අද සියලු භව බන්ධන මිදුවෙමි.

967. මෙයින් අපරිමෙයකල්පයෙහි පන්සිල් රැක්කෙමි. (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. මේ පන්සිල් (රැකීමේ) විපාකය යි.

968. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් **පඤ්චසීල සමාදානිය** ස්ථවිරයන් වහන්සේ මෙ ම ගාථාවන් වදාළසේක් යී.

**පඤ්චසීලසමාදානිය ස්ථවිරාවදානය සිවුවැනි යි.**

## 25. අන්නසංසාවක ස්ථවිරාවදානය

969-970. (අවන්හල් සහිත) ඇතුළු වීථියෙහි වඩින්නා වූ ස්වර්ණවර්ණ වූ රන්තොරණක් මෙන් බබලන දෙතිස් මහපුරිස්ලකුණු ඇති ලොව තබුළු වන්නා වූ අප්‍රමාණ ගුණ ඇති අනුපම (උපමා රහිත) වූ දැමුනා වූ දීප්තිය දරන්නා වූ **සිද්ධාර්ථ** බුදුරජානන් වහන්සේ දැක අධික වූ ප්‍රීතියක් ලැබීමි.

971. මම බුදුරජානන් වහන්සේට නිමන්ත්‍රණය කොට ඒ මහාමුනීන් වහන්සේ වැළඳවීමි. එකල්හි මහාකාරුණික වූ බුදුරජානන් වහන්සේ මට අනුමෝදනා (ධර්මය දෙශනා) කළසේක.

972. (සත්ත්වයාට) උතුම් වූ අස්වැසිලි කරණ ඒ මහාකාරුණික වූ බුදුරජානන් වහන්සේ කෙරෙහි සිත පහදවා මම කල්පයක් සවර්ගයෙහි සතුටු වීමි.

973. මෙයින් සිවු අනූවනකපෙහි වූ එකල්හි යම් දානයක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. භික්ෂාදානයාගේ මේ විපාකය යි.

974. ප්‍රතිසම්භිදාවෝ -පෙ- බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් **'අනනසංසාවක'** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක් යි.

**අනනසංසාවක ස්ථවිරාවදානය පස්වැනි යි.**

## 26. ධූපදායකස්ථවිරාදානය.

975. ලොකජ්‍යෙෂ්ඨ වූ තාදිගුණ ඇති **සිඞාර්ථ** බුදුරජානන් වහන්සේට පැහැදුනු සිතින් මා විසින් කුටිධූපයක් (ගඳ කිලියට සුවඳ දුමක්) දෙනලදී.

976. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යෝනියක උපදිම් නම් සියලු දෙනාට ම ප්‍රිය වෙමි. සුගන්ධධූපදානයාගේ මේ විපාකය යි.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාව
http://thripitakaya.org